© සියලු ම හිමිකම් ඇවිරිණි. අනු අංකය: ………………

# සහතිකලත් කළමනාකරණ ගණකාධිකාරීන්ගේ සංගමය (ශ්‍රී ලංකා)

## තාක්ෂණික අදියර

## 2008 මාර්තු විභාගය

| | | | | | |
|---|---|---|---|---|---|
| විභාග දිනය | : | 2008 මාර්තු 01 | පිටු ගණන | : | 06 |
| විභාග වේලාව | : | පෙ.ව. 9.30 - ප.ව. 12.30 | ප්‍රශ්න ගණන | : | 06 |

***අයදුම්කරුවන්ට උපදෙස්:***

1. වෙන්කළ කාලය පැය 03 යි.
2. සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
3. පිළිතුරු සිංහල භාෂාවෙන් සපයන්න.

| **විෂය** | **විෂය සංකේතය** |
|---|---|
| **මූල්‍ය ගිණුම්කරණ මූලිකාංග** | **FAF** |

---

**ප්‍රශ්න අංක 01** *(ලකුණු 14)*

(a) මූල්‍ය ගිණුම්කරණය යනු කුමක් ද යන්න කෙටියෙන් සඳහන් කරන්න. එය කළමනාකරණ ගිණුම්කරණයෙන් වෙනස් වන්නේ කෙසේ ද? *(ලකුණු 05)*

(b) ගණකාධිකරණ වෘත්තීය ඉහළට හැදෑරීමේ දී ඇතැම් ගිණුම්කරණ මූලධර්ම නිවැරදි ලෙස වටහා ගැනීම ඉතා වැදගත් වේ. පහත සඳහන් දේ කෙටියෙන් පැහැදිලි කරන්න.

(i) ව්‍යාපාර ඒකක විවිධ ආකාර ගන්නා බව සඳහන් කරමින් ව්‍යාපාර ඒකක මූලධර්මය
(ii) වාස්තවික මූලධර්මය
(iii) කාලඡේද මූලධර්මය *(ලකුණු 09)*

*(මුළු ලකුණු 14)*

**ප්‍රශ්න අංක 02** *(ලකුණු 15)*

(a) හවුල් ගිවිසුමක් නොමැති අවස්ථාවක දී පවත්වාගෙන යන හවුල් ව්‍යාපාරවලට අදාළ වන හවුල් ව්‍යාපාර සම්බන්ධ වැදගත් නීති පහක් දක්වන්න. *(ලකුණු 05)*

(b) 2006 වසර සඳහා රු. 785,950 ක ශුද්ධ ලාභයක් ලබාගෙන ඇති පරිගණක කොටස් අලෙවි කරන "ග්ලෝබ් පීසී හවුස්" ආයතනයේ හර්බට් සහ ඔලිවර් හවුල් ව්‍යාපාරිකයින් වශයෙන් කටයුතු කරයි.

වර්ෂ 5 ක් ව්‍යාපාර කටයුතු කිරීමෙන් පසු 2006.01.01 දිනට හර්බට්ගේ ප්‍රාග්ධන ගිණුමේ ශේෂය රු. 450,000 ක් වූ අතර, ඔලිවර්ගේ ප්‍රාග්ධන ගිණුමේ ශේෂය රු. 400,000 ක් විය. ප්‍රාග්ධන ගිණුමේ වර්ෂය මුල ආරම්භක ශේෂයට 12% ක ප්‍රාග්ධන පොලියක් බැර කෙරේ. ගැනිලි සඳහා 10% ක් වශයෙන් අග ශේෂය මත අය කෙරේ.

හවුල්කරුවන්ගේ මාසික වේතන:

| | |
|---|---|
| හර්බට් | රු. 12,000 |
| ඔලිවර් | රු. 10,000 |

වර්ෂයේ ගැනිලි:

| | |
|---|---|
| හර්බට් | රු. 280,000 |
| ඔලිවර් | රු. 230,000 |

ඉතිරි ලාභ හර්බට් 2/3 ක් සහ ඔලිවර් 1/3 අනුපාතයට බෙදාගත යුතු ය.

*ඔබ විසින්:*

(i) හවුල්කරුවන් අතර ලාභාලාභ විසර්ජනය කරන ආකාරය දක්වන්න. *(ලකුණු 04)*

(ii) හවුල්කරුවන්ගේ ජංගම ගිණුම් පිළියෙල කරන්න. *(ලකුණු 06)*

*(මුළු ලකුණු 15)*

## <u>ප්‍රශ්න අංක 03</u> *(ලකුණු 15)*

රු. 500,000 ක් වටිනා තමාගේම සින්නක්කර ගොඩනැගිල්ලක "ලිට්ල් කෙයාර්" සිල්ලර වෙළෙඳ ව්‍යාපාරිකයා අවුරුදු දෙකක් ව්‍යාපාර කටයුතු පවත්වාගෙන ගියේය. රු. 500,000 ක් වටිනා මෝටර් රථයක් 2005.07.01 දිනට ඔහු සතුව තිබිණ.

ඔහු නිසි පිළිවෙලට ගිණුම් පොත් පවත්වාගෙන ගියේ නැති නිසා ශේෂ පිරික්සුමක් පිළියෙල කිරීමට නොහැකි විය.

කෙසේ වෙතත් 2007 ජුනි 30 දිනෙන් අවසන් වසර සඳහා ඔහුගේ වර්තාවලින් පහත සඳහන් තොරතුරු සොයාගත හැකි විය.

බැංකුවෙන් ණය මුදලක් ලබාගැනීම සඳහා වාර්ෂික ගිණුම් පිළියෙල කිරීමට ඔහු බලාපොරොත්තු වේ. ඔහුගේ ව්‍යාපාර ලැබීම් හා ගෙවීම් පහත දක්වේ.

| *<u>ලැබීම්</u>* | රු.'000 | *<u>ගෙවීම්</u>* | රු.'000 |
|---|---|---|---|
| මුදලට විකුණුම් | 804 | මුදලින් කළ විවිධ වියදම් | 10 |
| ණයට විකුණුම්වලින් | | දුරකතන බිල්පත් | 75 |
| ණයගැනියන්ගෙන් ලද චෙක්පත් | 875 | විදුලිය | 40 |
| | | මෝටර් රථ වියදම් | 15 |
| | | රක්ෂණ | 15 |
| | | මුදලට ගැනුම් | 170 |
| | | වැටුප් හා වේතන | 440 |
| | | මුදල් ගැනිලි | 50 |
| | | ණයහිමියන්ට දුන් චෙක්පත් | 472 |
| | | ණය ආපසු ගෙවීම චෙක්පත්වලින් | 1,100 |
| | | ගැනිලි - චෙක්පත් | 175 |

පහත සඳහන් අතිරේක තොරතුරු සපයා දී ඇත.

| | 2006.07.01 ට<br>රු.'000 | 2007.06.30 ට<br>රු.'000 |
|---|---|---|
| මෝටර් රථ (ලියාහල වටිනාකම) | 375 | 250 |
| ඉතිරි තොග පිරිවැයට | 350 | 200 |
| වෙළෙඳ ණයගැතියෝ | 500 | 600 |
| වෙළෙඳ ණයහිමියෝ | 350 | 425 |
| ඉදිරියට ගෙවූ රක්ෂණ | 50 | 5 |
| අත ඉතිරි මුදල් | 75 | 19 |
| බැංකුවේ මුදල් | 1,550 | 678 |
| බැංකු ණය | 1,000 | - |
| උපචිත විදුලිය | 3 | 5 |
| උපචිත වැටුප් | 40 | 40 |

*මෙම වෙළෙන්දා සඳහා ඔබ විසින්:*

(a) ඔහුගේ මුදල් පොත ලියා දක්වන්න. *(ලකුණු 03)*

(b) 2006.07.01 දිනට ඔහුගේ ප්‍රාග්ධනය ගණනය කරන්න. *(ලකුණු 02)*

(c) 2007.06.30 දිනෙන් අවසන් වසර සඳහා ඔහුගේ වෙළෙඳ හා ලාභාලාභ ගිණුම ද, 2007.06.30 දිනට ශේෂ පත්‍රය ද පිළියෙල කරන්න. *(ලකුණු 10)*

*(මුළු ලකුණු 15)*

## ප්‍රශ්න අංක 04 *(ලකුණු 15)*

(a) ජිනදාස ව්‍යාපාරයේ 2007 අප්‍රේල් මාසයේ සිදු වූ පහත සඳහන් ගනුදෙනු වාර්තාගත කිරීමට අදාළ ජර්නල් සටහන් සංලක්ෂය ද ඇතුලත්ව ලියන්න.

(i) සඳහන් කළ මිල රු. 100,000 ක් වූ භාණ්ඩ අප්‍රේල් 03 දින බැස්ටියන්ගෙන් මිලට ගන්නා ලදී. මෙම තොග මිලට ගැනීම වෙනුවෙන් 10% ක වෙළෙඳ වට්ටමක් ලැබේ. මුදල් ගෙවා නිදහස් කරන විට 5% ක අතිරේක මුදල් වට්ටමක් ඉන්වොයිස් මිලෙන් ලැබිණ.

(ii) 2005 අප්‍රේල් 10 දින මිලට ගත් පිරිවැය රු. 800,000 ක් වූද, පිරිවැයට 25% බැගින් ක්ෂය කරනු ලැබූ මෝටර් රථයක් 2007 අප්‍රේල් 10 දින රු. 350,000 කට අලෙවි සමාගමකට විකුණන ලදී. එම සමාගමෙන්ම අලුත් මෝටර් රථයක් රු. 900,000 කට මිලට ගෙන ශේෂය පමණක් මුදලින් ගෙවීය.

(iii) 'මිලට ගැනීමේ හෝ ආපසු එවීමේ පදනම' මත ගනුදෙනුකරුවෙකුට යැවූ රු. 7,000 ක් වටිනා බඩු තොගයක් මාර්තු 31 දින වැරදීමකින් විකුණුම් ලෙස සලකා ඇත. වර්ෂයේ දළ ලාභය රු. 210,000 කි. *(ලකුණු 06)*

(b) 2007 ජනවාරි මාසය සඳහා එස්. සයිමන් මහතාගේ මුදල් පොතේ බැංකු තීරුවේ සටහන් හා බැංකු ගිණුම් විස්තරය පහත සඳහන් වේ.

**බැංකු විස්තරය (2007 ජනවාරි)**

| දිනය 2007 ජන | විස්තර | චෙක් අංකය | මුදල රු. | දිනය 2007 ජන | විස්තර | චෙක් අංකය | මුදල රු. |
|---|---|---|---|---|---|---|---|
| 02 | ජී.එල්. පර්සි | | 950 | 01 | ශේෂය ප/ගෙ | | 8,000 |
| 06 | ආර්. ලක්ෂ්මන් | 501 | 2,000 | 02 | මුදල් | | 4,000 |
| 14 | වී. අදිත්‍යා | 502 | 1,500 | 03 | එල්. පීරිස් | | 2,400 |
| 22 | මුදල් | 503 | 800 | 10 | විජේරාම | | 350 |
| 22 | මුදල් | 505 | 300 | 19 | ඩබ්. පර්සි | | 450 |
| 23 | එස්. සිල්වා | 506 | 1,500 | 24 | ඒ. පෙරේරා | | 380 |
| 25 | පී. ගුණසේන | 507 | 600 | 24 | එල්. පීරිස් | | 560 |
| 30 | බැංකු ගාස්තු | | 200 | | | | |
| 31 | චෙක් පොතේ පිරිවැය | | 10 | | | | |
| 31 | ශේෂය ප/ගෙ | | 8,280 | | | | |
| | | | 16,240 | | | | 16,240 |

**මුදල් පොත (බැංකු තීරුව)**

| දිනය 2007 ජන | විස්තර | චෙක් අංකය | මුදල රු. | දිනය 2007 ජන | විස්තර | චෙක් අංකය | මුදල රු. |
|---|---|---|---|---|---|---|---|
| 01 | ශේෂය ඉ/ගෙ | | 8,000 | 05 | ආර්. ලක්ෂ්මන් | 501 | 2,000 |
| 02 | මුදල් | | 450 | 09 | වී. අදිත්‍යා | 502 | 1,500 |
| 07 | ඩබ්. පර්සි | 0107 | 380 | 14 | මුදල් (වැටුප්) | 503 | 800 |
| 15 | ඒ. පෙරේරා | 768 | 560 | 19 | එල්. ජයසූරිය | 504 | 750 |
| 18 | එල්. පීරිස් | 1368 | 890 | 22 | මුදල් (ගැනිලි) | 505 | 300 |
| 26 | සී. දාස | 1465 | 360 | 25 | එස්. සිල්වා | 506 | 1,500 |
| 29 | එම්. මැන්දිස් | 0237 | | 27 | ගුණසේන | 507 | 600 |
| | | | | 30 | ආර්. ලක්ෂ්මන් | 508 | 1,000 |
| | | | | 31 | ශේෂය ඉ/ගෙ | | 6,190 |
| | | | 14,640 | | | | 14,640 |

*ඔබ විසින්:*

(i) 2007 ජනවාරි මාසය සඳහා බැංකු සැසඳුම් විස්තරය හා *(ලකුණු 05)*

(ii) අවශ්‍ය කාරණය සඳහා මුදල් පොතේ ගැලපීම් පෙන්විය යුතු ය. *(ලකුණු 04)*

*(මුළු ලකුණු 15)*

## <u>ප්‍රශ්න අංක 05</u> *(ලකුණු 26)*

(a) 2006 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වසර සඳහා පහත සඳහන් තොරතුරු සීමිත කොවලිටි නිෂ්පාදන සමටගමට අදාළ වේ. නිෂ්පාදන ක්‍රියාවලියට හා කර්මාන්තශාලාවට අදාළ තොරතුරු පහත දැක්වේ.

| | |
|---|---|
| 2006.01.01 දිනට ඉතිරි අමුද්‍රව්‍ය තොග | 12,000 |
| ඇසුරුම් ද්‍රව්‍ය | 5,000 |
| නොනිමි වැඩ | 5,000 |
| ද්‍රව්‍ය ගැනුම් | 200,000 |
| ඇසුරුම් ද්‍රව්‍ය ගැණුම් | 15,000 |
| කර්මාන්තශාලා වරිපනම් | 16,000 |
| කර්මාන්තශාලා විදුලිය | 30,000 |
| කර්මාන්තශාලා ගොඩනැගිලි පිරිවැයට | 100,000 |
| යන්ත්‍ර හා පිරියත (ලියාහල අගය) | 140,000 |
| කර්මාන්තශාලා ගොඩනැගිලි - නඩත්තු හා අලුත්වැඩියා | 11,000 |
| යන්ත්‍ර හා පිරියත - නඩත්තු හා අලුත්වැඩියා | 16,000 |
| පැස්සුම් ගාස්තු - කම්හලෙන් පිටත පැස්සුම් | 6,000 |

වර්ෂය අග තොරතුරු:

| | |
|---|---|
| අමුද්‍රව්‍ය තොග | 20,000 |
| ඇසුරුම් ද්‍රව්‍ය තොග | 5,000 |
| නොනිමි වැඩ | 15,000 |

ඇසුරුම් කර්මාන්තශාලාව තුළ දීම සිදු කෙරෙන අතර එය ඍජු වියදමකි.

යන්ත්‍ර හා පිරියත ලියාහල වටිනාකම මත 10% කින් ක්ෂය කළ යුතු ය.

ඔබ විසින් 2006 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වසර සඳහා සමාගමේ නිෂ්පාදන ගිණුම පිළියෙල කළ යුතුයි. *(ලකුණු 08)*

(b) පහත දැක්වෙන්නේ 2006 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වසර සඳහා එම සමාගමේ වෙළෙඳ කටයුතුවලට අදාළ ශේෂ පිරික්සුමයි.

| | රු. | රු. |
|---|---|---|
| කොටස් ප්‍රාග්ධනය: | | |
| රු. 10, 10% වරණීය කොටස් | | 50,000 |
| රු. 10 සමාන්‍ය කොටස් 25,000 | | 250,000 |
| පොදු සංචිතය | | 10,000 |
| 2006.01.01 ට ලාභාලාභ ගිණුම | | 25,000 |
| බැංකු ණය | | 80,000 |
| වෙළෙඳ ණයහිමියෝ | | 65,000 |
| නිමි බඩු - ආරම්භක තොග | 8,000 | |
| සින්නක්කර ඉඩම් | 181,000 | |
| ගොඩනැගිලි - පිරිවැයට | 100,000 | |
| කාර්යාල උපකරණ | 60,000 | |
| ලී බඩු හා වැද්දුම් | 15,000 | |
| ආයෝජන | 100,000 | |
| වෙළෙඳ ණයගැතියෝ | 140,000 | |
| විකුණුම් | | 660,000 |
| ආයෝජන ආදායම් | | 10,000 |
| කර්මාන්තශාලාවෙන් මාරු කරන ලද නිමි භාණ්ඩ - පිරිවැයට | 350,000 | |
| අධ්‍යක්ෂ ගාස්තු | 60,000 | |
| වේතන | 82,000 | |
| විදුලිය | 60,000 | |
| සන්නිවේදන වියදම් | 14,000 | |
| ලිපිද්‍රව්‍ය හා මුද්‍රණ | 6,000 | |
| රක්ෂණ | 10,000 | |

| | | |
|---|---|---|
| බැංකු ගාස්තු | 3,000 | |
| ණය පොලී | 5,000 | |
| ක්ෂය සඳහා වෙන්කිරීම: | | |
| ගොඩනැගිලි | | 10,000 |
| කාර්යාල උපකරණ | | 15,000 |
| ලී බඩු හා වැද්දුම් | | 10,000 |
| උපචිත වියදම් | | 23,000 |
| බැංකුවේ මුදල් | 10,000 | |
| අතැති මුදල් | 4,000 | |
| | 1,208,000 | 1,208,000 |

පහත සඳහන් තොරතුරු සැලකිල්ලට ගත යුතු ය.

- රු. 10 සාමාන්‍ය කොටස් 50,000 කින් සහ රු. 10, 10% වරණීය කොටස් 10,000 කින් සමාගමේ අනුදත් ප්‍රාග්ධනය සමන්විත වේ.
- 2006.12.31 දිනට ඉතිරි නිමි තොග රු. 32,000 කි.
- විකුණුම් කොමිස් සඳහා රු. 5,000 ක් ද, විගණන ගාස්තු සඳහා රු. 15,000 ක් ද වෙන් කරන්න.
- ගොඩනැගිලි 4%, කාර්යාල උපකරණ 10%, ලී බඩු හා සවිකිරීම් 10% බැගින් ක්ෂය කරන්න.
- ණයගැතියන්ගෙන් 5% ක් බොල් ණය හා අඩමාන ණය සඳහා වෙන් කරන්න.

*ඔබ විසින්:*

(i) 2006.12.31 දිනෙන් අවසන් වසර සඳහා වෙළෙඳ හා ලාභාලාභ ගිණුම ද, ලාභාලාභ විසර්ජන ගිණුම ද අභ්‍යන්තර ප්‍රයෝජනය සඳහා පිළියෙල කළ යුතු ය.

(ii) 2006.12.31 දිනට ශේෂ පත්‍රය පිළියෙල කරන්න. *(ලකුණු 18)*

*(මුළු ලකුණු 26)*

## <u>ප්‍රශ්න අංක 06</u> *(ලකුණු 15)*

2006.07.01 දිනට නිව් ස්ටාර්ස් ක්‍රිකට් සමාජයේ වත්කම් හා බැරකම් පහත දැක්වේ.

| | රු. |
|---|---|
| අතැති මුදල් | 3,000 |
| ඉතිරි කිරීමේ ගිණුම | 115,000 |
| ක්‍රීඩා උපකරණ - ලියාහල වටිනාකමට | 65,000 |
| ගෙවිය යුතු විදුලි බිල් | 5,000 |
| ගොඩනැගිලි අරමුදල | 25,000 |
| ලැබිය යුතු සාමාජික මුදල් | 30,000 |
| ලී බඩු හා කාර්යාල උපකරණ - ලියාහල වටිනාකමට | 35,000 |

සමාජයේ භාණ්ඩාගාරික විසින් පිළියෙල කරන ලද වර්ෂයේ සාරාංශගත ලැබීම් හා ගෙවීම් පහත දැක්වේ.

| *<u>ලැබීම්</u>* | රු. | *<u>ගෙවීම්</u>* | රු. |
|---|---|---|---|
| අතැති මුදල් ශේෂය | 3,000 | කාර්යාල වේතන | 30,000 |
| ලැබුණ සමාජික මුදල් | 100,000 | ක්‍රීඩා භූමි සේවක වැටුප් | 15,000 |
| ප්‍රදර්ශණ තරඟ වෙනුවෙන් | | විදුලි බිල් | 10,000 |
| අලෙවි කළ ප්‍රවේශ පත්‍ර | 190,000 | ඉතිරිකිරීම් තැන්පත් | 75,000 |
| රිදී ජුබිලිය වෙනුවෙන් | | දුරකථන බිල් | 8,000 |
| අලෙවි කළ සමරු පොත් | 13,000 | වෙනත් වියදම් | 15,000 |
| | | සමරු පොත් මුද්‍රණය | 3,000 |
| | | ප්‍රදර්ශණ තරඟ වියදම් | 45,000 |
| | | ශේෂය ප/ගෙ | 105,000 |
| | 306,000 | | 306,000 |

2007 ජුනි 30 දිනට සමාජයේ තත්ත්වය පහත දැක්වේ.

- වසරකට රු. 1,000 බැගින් සාමාජික මුදල් ගෙවන සමාජයේ සාමාජික සංඛ්‍යාව 100 කි.
- සාමාජිකයින් 30 දෙනෙකු සාමාජික මුදල් ගෙවිය යුතු අතර කිසිවකු ඉදිරියට සාමාජික මුදල් ගෙවා නැත.
- කාර්යාල අපකරණ හා ක්‍රීඩා උපකරණ 10% බැගින් ක්ෂය කළ යුතු ය.
- 2007.06.30 දිනට බැංකු ප්‍රකාශය අනුව ඉතිරිකිරීමේ ගිණුමේ ශේෂය රු. 200,000 කි.
- තැන්පත් කරන ලද මුදල් අනුව කිසියම් වෙනසක් ඇතොත් එය විටින් විට බැර කරන ලද පොලී නිසා සිදු විය.
- 2007 ජුනි 30 දිනට උපචිත වැටුප් රු. 40,000 කි. විදුලි බිල් රු. 5,000 කි.
- 25 වැනි රිදී ජුබිලිය අනුස්මරණය කිරීම වෙනුවෙන් ආරාධිත ක්‍රීඩකයින් ගෙන්වා පවත්වන ලද විශේෂ තරඟ ක්‍රීඩකයින් වෙනුවෙන් විකුණු ප්‍රවේශ පත්වලින් ලද ශුද්ධ මුදල ක්‍රීඩා ගොඩනැගිලි අරමුදල සඳහා වේ.

ඔබ විසින්:

(a) සාරාංශගත මුදල් පොත පිළියෙල කළ යුතු ය.

(b) 2006.07.01 දිනට සමුච්චිත අරමුදල ගණන් බැලූ ආකාරය දැක්විය යුතු ය.

(c) 2007 ජුනි 30 දිනෙන් අවසන් වසර සඳහා ක්‍රීඩා සමාජයේ ආදායම් සහ වියදම් ගිණුම ද, 2007 ජුනි 30 දිනට පෙරවැඩ ලෙස ශේෂ පත්‍රය ද පිළියෙල කළ යුතු ය.

*(මුළු ලකුණු 15)*

*ප්‍රශ්න පත්‍රයේ අවසානය*